# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1907/12 – 2015 මාර්තු 23 වැනි සඳුදා – 2015.03.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/10/09/2013.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත 4(1) වන වගන්තිය යටතේ නියෝගය**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

එක් පාර්ශ්වයක් වශයෙන්

ජී. එල්. එස්. දිසානායක මිය, අංක 22, පීටර්ස් ලේන්, දෙහිවල

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්

ද ශ්‍රී ලංකා ලිබියා ඇග්‍රිකල්චරල් ඇන්ඩ් ලයිව්ස්ටොක් ඩිවලොප්මන්ට් කම්පැනි ලිමිටඩ්, (The Sri Lanka - Libiya Agricultural and Livestock Development Company Ltd.) 3 වැනි මහල, "ලන්ලිබ්" ගොඩනැගිල්ල, නො. 46/56, නවම් මාවත, කොළඹ 02.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

අධිකරණ හා කම්කරු සබඳතා අමාත්‍ය, විජයදාස රාජපක්ෂ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් බොරලැස්ගමුව, පිරිවෙන පාර, අංක 128හි, එස්. විරිතමුල්ල මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**විජයදාස රාජපක්ෂ,**
අධිකරණ හා කම්කරු සබඳතා අමාත්‍ය.

2015 මාර්තු මස 12 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/10/09/2013.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එක් පාර්ශ්වයක් වශයෙන්

ඒ. එල්. එස්. දිසානායක මිය, අංක 22, පීටර්ස් ලේන්, දෙහිවල

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්

ද ශ්‍රී ලංකා - ලිබියා ඇග්‍රිකල්චරල් ඇන්ඩ් ලයිව්ස්ටොක් ඩිවලොප්මන්ට් කම්පැනි ලිමිටඩ්, (The Sri Lanka - Libiya Agricultural and Livestock Development Company Ltd.) 3 වැනි මහල, ''ලන්ලිබ්'' ගොඩනැගිල්ල, අංක 46/56, නවම් මාවත, කොළඹ 02.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ,

''ද ශ්‍රී ලංකා - ලිබියා ඇග්‍රිකල්චරල් ඇන්ඩ් ලයිව්ස්ටොක් ඩිවලොප්මන්ට් කම්පැනි ලිමිටඩ්, (The Sri Lanka - Libiya Agricultural and Livestock Development Company Ltd.) හි සේවය කරනු ලැබූ ඒ. එල්. එස්. දිසානායක මහත්මියට වැටුපට අමතරව ලබාදෙන ලද ජල බිල්පත්, විදුලි බිල්පත්, දුරකතන බිල්පත්, වෛද්‍ය බිල්පත් ආදිය 2007 ජනවාරි මස සිට 2008 දෙසැම්බර් මාසය දක්වා ලබා නොදීමත් ඊට අමතරව නිවාස කුලී දීමනාව (Rent Allowance), සංග්‍රහ දීමනාව (Entertainment Allowance), ආදිය 2008 පෙබරවාරි මස සිට 2008 සැප්තැම්බර් මාසය දක්වා ලබා නොදීමත් යුක්ති සහගත ද? එසේ යුක්තිසහගත නොවන්නේ නම් ඇයට ලබාදිය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ.''

**හේරත් යාපා,**
කම්කරු කොමසාරිස්.

2015 පෙබරවාරි මස 23 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

04 - 235

---

මගේ අංකය: IR/21/72/2008.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත් වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2014.11.03 වන දින අංක 1887/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට්* පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2014.10.13 වැනි දින දරන නියෝගයෙන්,

එක් පාර්ශ්වයක් වශයෙන්

අන්තර් සමාගම් සේවක සංගමය, අංක 115-ඩී, කලපලුවාව පාර, කොස්වත්ත, තලංගම (ටී. ඒ. එම්. ප්‍රියන්ත මයා වෙනුවෙන්)

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්

ලංකා ඉලෙක්ට්‍රිසිටි කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්, ඊ. එච්. කුරේ ගොඩනැගිල්ල, නො. 411, ගාලු පාර, කොළඹ 03.

අතර පවත්නා 2014.10.04 දින දරන කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳව වූ කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් කාන්ති ශ්‍රී දේවි රණසිංහ මහත්මිය වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින් අධිකරණ හා කම්කරු සබඳතා අමාත්‍ය විජයදාස රාජපක්ෂ වන මා එම නියෝගය අවලංගු කරන අතර එකී 2014.10.13 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙසද මෙයින් නියෝග කරමි.

**විජයදාස රාජපක්ෂ,**
අධිකරණ හා කම්කරු සබඳතා අමාත්‍ය.

2015 මාර්තු මස 12 වැනි දින,
කොළඹ දී ය.
04 236/1

---

මගේ අංකය: අයිආර්/21/72/2008.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියමකර දක්වා ඇති කාරණය පිළිබඳව:

එක් පාර්ශ්වයක් වශයෙන්

අන්තර් සමාගම් සේවක සංගමය, අංක 259/9, සෙත්සිරි මාවත, කොස්වත්ත, තලංගම. (ටී. ඒ. එම්. ප්‍රියන්ත මයා වෙනුවෙන්

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්

ලංකා ඉලෙක්ට්‍රිසිටි කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්, ඊ. එච්. කුරේ ගොඩනැගිල්ල, අංක 411, ගාලු පාර, කොළඹ 03.

කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

අධිකරණ හා කම්කරු සබඳතා අමාත්‍ය විජයදාස රාජපක්ෂ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සම කියවා) දරණ පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බොරලැස්ගමුව, අබේරත්න මාවත, නො. 28 හි, එස්. කාරියවසම් මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**විජයදාස රාජපක්ෂ,**
අධිකරණ හා කම්කරු සබඳතා අමාත්‍ය.

2015 මාර්තු මස 12 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: අයිආර්/21/72/2008.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එක් පාර්ශ්වයක් වශයෙන්

අන්තර් සමාගම් සේවක සංගමය, නො. 259/9, සෙත්සිරි මාවත, කොස්වත්ත, තලංගම. (ටී. ඒ. එම්. ප්‍රියන්ත මයා වෙනුවෙන්)

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්

ලංකා ඉලෙක්ට්‍රිසිටි කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්, ඊ. එච්. කුරේ ගොඩනැගිල්ල, නො. 411, ගාලු පාර, කොළඹ 03.

*ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණ වනුයේ,*

ලංකා විදුලි පුද්ගලික සමාගමේ සේවය කරනු ලබන ටී. ඒ. එම්. ප්‍රියන්ත මහතා 1988.01.01 දින සිට I වැනි ශ්‍රේණියේ E - 5 වැටුප් තලය ලබා ගැනීම වෙනුවෙන් කරනු ලබන ඉල්ලීම යුක්ති සහගතද එසේ යුක්ති සහගත වන්නේ නම් ඔහුට ලැබිය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ.

**හේරත් යාපා,**
කම්කරු කොමසාරිස්.

2015 පෙබරවාරි මස 23 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

04 - 236/2

---

මගේ අංකය: IR/13/09/2013.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2014.09.01 වන දින අංක 1878/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2014.08.19 වැනි දින දරන නියෝගයෙන්,

එක් පාර්ශ්වයක් වශයෙන්

ඩබ්. බී. සිරිපාල මයා, පලටුපාන ලේවාය, කිරින්ද, තිස්සමහාරාමය,

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්

ලංකා සෝල්ට් ලිමිටඩ්, මහලේවාය, හම්බන්තොට

අතර පවත්නා 2014.08.21 දින දරන කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳව වූ කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් ඩබ්. ජී. එල්. වයි. එම්. විල්ලද්දර මෙනවිය වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින් අධිකරණ හා කම්කරු සබඳතා අමාත්‍ය විජයදාස රාජපක්ෂ වන මා එම නියෝගය අවලංගු කරන අතර එකී 2014.08.19 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙසද මෙයින් නියෝග කරමි.

**විජයදාස රාජපක්ෂ,**
අධිකරණ හා කම්කරු සබඳතා අමාත්‍ය.

2015 මාර්තු මස 12 වැනි දින,
කොළඹ දී ය.

04 - 237/1

---

මගේ අංකය: IR/13/09/2013.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

එක් පාර්ශ්වයක් වශයෙන්

ඩබ්. බී. සිරිපාල මයා, පලටුපාන ලේවාය, කිරින්ද, තිස්සමහාරාමය

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්

ලංකා සෝල්ට් ලිමිටඩ්, මහලේවාය, හම්බන්තොට

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

අධිකරණ හා කම්කරු සබඳතා අමාත්‍ය, විජයදාස රාජපක්ෂ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් කෝට්ටේ, බැද්දගාන පාර, විනිසුරු නිවාස සංකීර්ණය, නො. ඩී. 40හි උපාලි සමරවීර මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**විජයදාස රාජපක්ෂ,**
අධිකරණ හා කම්කරු සබඳතා අමාත්‍ය.

2015 මාර්තු මස 12 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/13/09/2013.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)

එක් පාර්ශ්වයක් වශයෙන්

ඩබ්. බී. සිරිපාල මයා, පලටුපාන ලේවාය, කිරින්ද, තිස්සමහාරාමය

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්

ලංකා සෝල්ට් ලිමිටඩ්, මහලේවාය, හම්බන්තොට

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ,
" හම්බන්තොට, ලංකා සෝල්ට් ලිමිටඩ් යටතේ පලටුපාන මහලේවායෙහි සේවය කළ ඩබ්. බී. සිරිපාල නමැති අයගේ වැඩ තහනම් කර සිටි 1986.01.31 සිට 2004.11.01 දින කාලසීමාව සඳහා හිඟ වැටුප් සහ උසස්වීම් ලබා නොදීමෙන් ඔහුට යම් අසාධාරණයක් සිදුව ඇත්ද? එසේ සිදුවී ඇත්නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේද'' යන්න පිළිබඳව වේ.

**හේරත් යාපා,**
කම්කරු කොමසාරිස්.

2015 පෙබරවාරි මස 23 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

04 - 237/2

මගේ අංකය: IR/22/31/2011 (II).

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කරුණු පිළිබඳව–

එක් පාර්ශ්වයක් වශයෙන්

ඒ. ඩබ්. එන්. හරිස්චන්ද්‍ර වඩුගේ මයා, අංක 20, "සාරානාත්", තල්ගහවෙල, මුගුණුවටවන, හලාවත.

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුල පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

අධිකරණ හා කම්කරු සබඳතා අමාත්‍ය විජයදාස රාජපක්ෂ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කොළඹ 05, කිරුලපන ඇවනිව්, අංක 153/1, වී. විමලරාජා මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**විජයදාස රාජපක්ෂ,**
අධිකරණ හා කම්කරු සබඳතා අමාත්‍ය.

2015 මාර්තු මස 12 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/22/31/2011 (II).

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එක් පාර්ශ්වයක් වශයෙන්

ඒ. ඩබ්. එන්. හරිස්චන්ද්‍ර වඩුගේ මයා, අංක 20, "සාරානාත්", තල්ගහවෙල, මුගුණුවටවන, හලාවත.

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුල පාර, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

I. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ හලාවත ඩිපෝවේ සේවය කර දැනට පුත්තලම ඩිපෝවට ස්ථාන මාරු ලබා සේවය කරන ඒ. ඩබ්. එන්. හරිස්චන්ද්‍ර වඩුගේ මහතාට එරෙහිව පවත්වන ලද විනය පරීක්ෂණය හේතුවෙන් වැඩ තහනම් කර සිටි 2010.10.28 දින සිට 2011.01.17 දින දක්වා කාලයට අදාළව හිඟ වැටුප් ලැබීමට හිමිකම් තිබේද යන්න හා එලෙස හිමිකම් තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් මොනවාද යන්න,

සහ

II. ඒ. ඩබ්. එන්. හරිස්චන්ද්‍ර වඩුගේ මහතාට එරෙහිව පවත්වන ලද විනය පරීක්ෂණය මගින් ලබා දී ඇති දඬුවම් හේතුවෙන් යම් අසාධාරණයක් සිදුවී ඇත්ද යන්න හා එලෙස අසාධාරණයක් සිදුවී ඇත්නම් ඔහුට හිමිවිය යුතු සහන මොනවාද යන්න පිළිබඳව වේ.

**හේරත් යාපා,**
කම්කරු කොමසාරිස්.

2015 පෙබරවාරි මස 23 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

04 – 238

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.